# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව |
| **දිනය** | : | 2012.10.19 |
| **වේලාව** | : | පෙ.ව. 9.00 |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයः**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | ගරු නාගරික මනත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | ගරු නාගරික මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

* ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා හට මෙදින රැස්වීමට සහභාගී වීමට නොහැකි ලිපියක් මගින් දැනුම්දෙන ලදී.

**නිලධාරී සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | ලේකම් | එම්. එච්. සීලවතී මිය |

## 01 ආගම සිහි කිරීමः

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුමා සභාව අමතමින් මෙම පවත්වන්නට යෙදෙන්නේ 2012 වර්ෂයේ ඔක්තෝබර් මාසයට අදාල මහා සභා රැස්වීම බව දන්වන ලද අතර මෙම මාසයේම 10 වන දින විශේෂ මහා සභා රැස්වීමක්ද පැවැත්වූ බවත්, එසේ පැවැත්වීමට යෙදුනේ ඉන්දුනීසියාවේ යොග්යකර්තා නගරයේ පැවැත්වෙන ආපදා කළමනාකරණය පිළිබඳ අමාත්‍ය සමුළුවට තමන් සහ මෙම නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා සහභාගී වීම සම්බන්ධව තීරණයක් ගැනීමට බවත් දැන්වීය. එම ගමනට පෙර ඒ ගැන සභාවට දැන්වීමට අවශ්‍ය හෙයින් මෙම මස 25 වන දිනට පැවැත්වීමට තිබූ මහා සභා රැස්වීම 19 වන දින පැවැත්වීමට සිදු වූ බවත්, එහි දී සිදු වූ අපහසුතාවයක් සිදු වූයේ නම් ඒ සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන බවත්, එම තත්වය යටතේ මෙම සභාවාරයට සහභාගී වූ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාහට ස්තුතිය පළ කරන බවත් දැනුම් දුන්නේය. මෙම සභා වාරයට පැමිණි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ලබන සභා වාරයේ සිට බළන්ගොඩ නගර සභාවේ මහා සභා රැස්වීම් සම්මත මහා සභා පැවැත්වීමේ රීතීන්ට අනුවම පැවැත්වීමට කටයුතු කළ යුතු බවත් දැන්වීය.

## 03. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

වාර්තාවේ අන්තර්ගතයට විරුද්ධව කරුණු හා සංශෝධන ඉදිරිපත් නොවූ අකර එය කියවූ බව සලකා ඒකච්ඡන්දයෙන් මහා සභාවේ අනුමත විය.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

### 04:01 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මහතා සභාව අමතමින්, පසුගිය සභා වාරයේ දී තමන් විසින් මැතිවරණ ජයග්‍රහණය ආදිය සම්බන්ධව ප්‍රකාශ කර තිබූ බොහෝ කරුණු සභා වාර්තාවට ඇතුලත්ව නොමැති බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා එයට පිළිතුරු දෙමින්, සභාවේ සංවාදයට ගත යුත්තේ සහ සභා වාර්තාවට ඇතුලත් වන්නේ න්‍යාය පත්‍රයට අනුකූල කරුණු පමණක් බව සිහිපත් කළේය.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 ගරු නාගරික මන්ත්‍රී අසංක විජයසිංහ මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම

අත්‍යවශ්‍ය කාරණයක් හේතුවෙන් 2012.10.19 වන දින මහා සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා ගරු නාගරික මන්ත්‍රී අසංක විජයසිංහ මැතිතුමා විසින් එවා තිබූ ලිපියට අනුව එතුමන් හට එදින සභාවේ නිවාඩු ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. විරුද්ධව කරුණු ඉදිරිපත් නොවූ බැවින් නිවාඩු ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 06:02 කසළ එකතු කිරීම සඳහා ලංසු කැඳවීම

බළන්ගොඩ නගරයේ (මේ සමග ඉදිරිපත් කරන අංක 01හි ඇති උපලේඛනයේ 2013 වර්ෂයට අදාල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මට අදාලව වැඩිදුරටත් විස්තර කරනු ලබන පරිදි) මාර්ග අතුගෑම, කසළ එකතු කිරීම, අවසාන බැහැරලීම, කසළ කළමනාකරණ මධ්‍යස්ථානය දක්වා ගෙන යාම, අවශ්‍ය විටෙක කසළ වෙන් කර එකතු කිරීම, කාණු වලින් ගොඩදමන පස් එකතු කිරීම, මාර්ග වල වැලි ඉවත් කිරීමේ සේවාව, බස් නැවතුම්පොල සහිත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල හා බස් නැවතුම්පොල භූමිය හා පොල ඇතුළත්ව නගර සභාව විසින් වෙන් කර දෙනු ලබන මාර්ග වල සහ ස්ථාන වල අත් කරත්තයෙන් කසළ ඉවත් කිරීම ද ඇතුළුව දෛනිකව සේවකයන් අදාල කාර්යය සඳහා යොදවා ගැනීම පිණිස නගර සභාව විසින් සපයනු ලබන ට්‍රැක්ටර් සහ රියදුරන් උපයෝගී කර ගනිමින් ඉහත කී සේවාවන් 2013.01.01 වන දින සිට 2013.12.31

වන දින දක්වා පවත්වාගෙන යාම සඳහා නගර සභා ආඥා පනතේ 36(ඊ) වගන්තිය සහ 40 වන වගන්තියඅනුව සේවාව බඳු දීම සඳහා ලංසු කැඳවීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධව කරුණු ඉදිරිපත් නොවූ බැවින් සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:03 බස් නැවතුම්පොල සහ මහජන පොල පොදු වැසිකිළි සඳහා ලංසු කැඳවීම**

2013 වර්ෂයේ බළන්ගොඩ බස් නැවතුම්පොල හා වෙළඳ සංකීර්ණය පොදු වැසිකිළි නඩත්තුව, පිරිසිදු කිරීම හා ගාස්තු අය කිරීම සඳහා 2013.01.01 වන දින සිට 2013.12.31 වන දින දක්වා නගර සභා ආඥා පනතේ 36(ඊ) සහ 40 වන වගන්තිය යටතේ සේවාව බදු දීම සඳහා ලංසු කැඳවීම සුදුසු බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධව කරුණු ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 2013 වර්ෂයට වරිපනම් පැනවීම**

255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 238 වන වගන්තියේ (1) උප වගන්තියෙන් නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුලත (අලුතින් එක් වූ ප්‍රදේශ හැර) පිහිටි සියළුම නිවාස වල, ගොඩනැගිලි වල, ඉඩම්වල හා ගෙපත් වල 2012 වර්ෂයෙ වාර්ෂික වටිනාකම් 2013 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්,

එකී නගර සභා ආඥා පනතේ 160 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් -

(අ) නේවාසික ස්ථාන මත සියයට හතර (4%)ක වරිපනමක් දඃ සහ

(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට පහ (5%)ක වරිපනමක් ද,

2013 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ ඒ වරිපනම්, එකී නගර සභා ආඥා පනතේ 170 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී මහා නගර සභා ආඥා පනතේ 230 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවල දී අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් සුදුසු බව ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මහතා විසින් සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධව කරුණු ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 2013 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම**

නගර සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ බළන්ගොඩ නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බළන්ගොඩ නගර සභාව විසින් 2013 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 162 වන වගන්තිය සමග කියවිය යුතු 164 වන වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ 1 වන

තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයට බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධව කරුණු ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**60:06 2013 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීමඃ**

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 165අ වන වගන්තියෙන් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුලත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ 11 වන තීරුවේ, ඒ ඒ එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2013 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2013 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර බළන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධව කරුණු ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 2013 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම**

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 165ආ වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී ආඥා පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 165අ වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2013 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එයි 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2013 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2013 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර බළන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධ අදහස් හා යෝජනා නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව -2012/2013**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පවත්වනු ලබන පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා නගර සභාවේ සේවයේ නියුතු කළමනාකරණ සහකාර ටී. එන්. ආර්. ද සොයිසා මහතා හා අමිතා කරුණාරත්න මහත්මිය විසින් ඉල්ලීමක් කර ඇති බැවින් එම පාඨමාලාව සහා අරමුදලින් වියදම් දරා හැදෑරීමට සහා අනුමැතිය ලබා දීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් පල නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 පළාත් පාලන මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2011/2012/2013**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් මෙහෙයවනු ලබන පළාත් පාලන මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා නගර සභාවේ කළමනාකරණ සහකාරවරයකු වශයෙන් සේවයේ නියුතු ඒ. එම්. සී. කේ. සෙනෙවිරත්න මහතා විසින් අනුමැතිය ඉල්ලා ඇති බැවින් ඒ සඳහා සහා අරමුදලින් රු. 20,000.00ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් නොමැති වූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 බී. 8 සහ බී. 9 දරන කඩකාමර ඉදිරියෙන් ඇති බිත්තිය කඩා ඉවත් කිරීම**

බස් නැවතුම්පොල බී. 8 සහ බී. 9 කඩකාමර ඉදිරියෙන් ඇති බිත්තිය හේතුවෙන් එම කඩකාමර අවහිර වන බැවින් එම බිත්තිය කඩා ඉවත් කර දෙන මෙන් අදාල කඩකාමර හිමියන්ගෙන් ඉල්ලීමක් ඇති බැවින් එම බිත්තිය ඉවත් කිරීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම බිත්තිය ඉවත් කිරීමෙන් අනෙකුත් ගොඩනැගිලි වලට වන බලපෑම සම්බන්ධව වැඩ අධිකාරී සහ ආදායම් පරීක්ෂකගෙන් වාර්තාවක් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීමට මහා සභාව තීරණය කරන ලදී.

**06:11 ලේඛනාගාර භාරකරු තනතුර**

නගර සභාවේ ලේඛනාගාර භාරකරු තනතුරේ රාජකාරි කටයුතු ආවරණය කිරීම සඳහා ඒ. කේ. අමිල ප්‍රසාද් මහතා විසින් ඉල්ලා ඇති බැවින් එම තනතුරේ රාජකාරි කටයුතු ආවරණය කිරීම එම මහතා වෙත ලබා දීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය වටිනා ලියකියවිලි වල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු තනතුරක් වන හෙයින් ස්ථිර සේවකයකු පත් කළ යුතු බවට මහා සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

**06:12 බස් නැවතුම්පොල අංක 9 කඩකාමරය පවරා දීම**

බස් නැවතුම්පොල අංක 9 කඩකාමරය බදු කුලී පදනම මත ලබා ගෙන සිටින තැනැත්තා එම කඩකාමරය මේ වන විට වසා දමා ඇති බව ද, එබැවින් නගර සභාව වෙත කළ යුතු ගෙවීම් මාස කිහිපයක් සිදු නොකර ඇති බව ද, එම කඩ කාමරය නැවත නගර සභාව වෙත පවරා ගන්නා මෙන්ද ඉල්ලා ඇති බැවින් එම කඩකාමරය පවරා ගැනීම සුදුසු බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, හිඟ මුදල් අය කර කඩකාමරය වෙනත් අයකු වෙත ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී. එමෙන්ම මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් නිමල් ධර්මසිරි යන අය ද සිදු කර ඇති බැවින් එම කඩ කාමරය ඔහු වෙත ලබා දීමට ද මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:13　2013 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම**

නගර සභාවට 2013 ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා අවශ්‍ය භාණ්ඩ සහ සේවා සපයා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන් හා සුදුසු සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම සඳහාත්,

ඒ සඳහා සකසන ලද සිංහල මාධ්‍ය දැන්වීම දිනමිණ පුවත්පතෙහිත්, දමිළ මාධ්‍ය දැන්වීම තිනකරන් පුවත්පතෙහිත්, පලකිරීමටත්, එම දැන්වීම නගර සභා ජාල අඩවියේ පළ කිරීමටත්, මෙම වර්ෂය සඳහා සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අයට මේ සම්බන්ධව ලිඛිතව දැනුම් දීමටත්,

2013 වර්ෂය සඳහා එක් අයිතමයක් වෙනුවෙන් මෙම සභාවේ ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු. 500.00 බැගින් සහ එම මුදලට රජය විසින් අනුමත කර ඇති එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද එකතු කර අය කිරීමටත් අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් නොමැති වූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06.14　නවතා තබන වාහන සඳහා ගාස්තු අය කිරීම**

බළන්ගොඩ බස් නැවතුම්පොලේ නවතා තබන ලද වාහන වලින් එම්. ජී. පියසේන මහතා යොදවා ගාස්තු අයකිරීමටත් එයින් 45%ක කොමිස් මුදලක් ඔහු වෙත ලබා දීමටත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් දී ඇති අතර, එහි වෑන් රථයකට රු. 50.00 ද, ලොරියක් සඳහා රු. 50.00 ද, කාර්/ජීප් රථ සඳහා රු. 30.00ක්ද වශයෙන් වන ගාස්තු අයකරන අතර, බස් නැවතුමට යාබද සතිපොල ඉදිරිපිට හා කාර්පාක් ඉදිරිපිට බස්නැවතුමටට පිවිසුම් මාර්ගයේ නිතර වාහන නතර කරන බැවින් එම වාහන වලින්ද ගාස්තු අය කිරීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, මේ පිළිබඳව පසුව සලකා බැලීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:15　පැරණි සේවා ස්ථානය නැවත ලබා දීම**

ගරු සභාපතිතුමාගේ නියෝගය මත ලබා දුන් නව සේවා ස්ථානයේ සේවා කටයුතු සිදු කිරීමට නොගැලපෙන බැවින් පෙර ස්ථානය නැවත ලබා දෙන මෙන් ඩී. සී. එස්. ද සිල්වා මහතා ඉල්ලීමක් කර ඇති බැවින් එම ස්ථානය සුදුසු පරිදි ගොඩනගා නැවත ලබා දීම සඳහා ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, කඩකාමර දෙකක් සකස් කර බදු දීමටත්, අදාල බදු මුදල තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තීරණය කර ගැනීමට ද මහා සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**06:16　බස් නැවතුම්පොල වැසිකිළි 04ක් කඩ කාමර වශයෙන් සකස් කිරීම**

2012.10.19 වන දින පැවති මහා සභාවේ යෝජනා අංක 06:07 යටතේ මහා සභාව විසින් සම්මත කරන ලද පරිදි බස්නැවතුම්පොල වැසිකිළි 04ක් කඩකාමර ලෙස නැවත සකස් කළ පසු එම කඩකාමර වලට යාබද කඩකාමරයේ තක්සේරු මුදලම අය කිරීමටත්,

එයලබා ගන්නා කඩකරු වෙතින් මාස 06ක තැන්පත් මුදලක් රැගෙන මාසික කුලී පදනම මත බදු දීමටත් ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:16 අන්තරායකර හා අප්‍රසන්න ව්‍යාපාර**

ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරිය වූ නගර සභා ආඥා පනතේ 164(1) වගන්තිය අනුව නගර සභාව විසින් සාදන ලද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ අංක 11263 හා 1958.02.21 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත අන්ත්‍රාදායක හා අප්‍රසන්න ව්‍යාපාර ලෙෂ බළන්ගොඩ නගර සභාව විසින් පිළිගෙන ඇති පහත සඳහන් කර්මාන්ත සඳහා බළන්ගොඩ නගර සභාව විසින් 2012 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමග කියවිය යුතු 164 වන වගන්තියෙන් නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛනයේ 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

| **1 වන තීරුව** | | **11 වන තීරුව** | | |
|---|---|---|---|---|
| | | **ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්** | | |
| **අනු අංකය** | **කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය** | **750 නොඉක්මවන අවස්ථාවක** | **750ට වැඩි එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක** | **1,500 ඉක්මවන අවස්ථාවක** |
| 01. | නවාතැන් පොලවල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 02. | තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 03. | හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 04. | බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 05. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 06. | ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 07. | භෝජනාගාරයක් (Restaurant) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 08. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 09. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 11. | මස් හෝ මාළු විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 12. | වී මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13. | සත්ත්ව ආහාර අලෙවි කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 14. | දිය ලුණු පැකට් කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 15. | පපඩම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1,000.00 |
| 16. | කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 17. | ගරාජ් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 18. | වෑල්ඩින් වැඩපොලවල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 19. | මුද්‍රණාල පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 20. | බෝතල්/පත්තර/ගෝනි විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |

## 07. ටෙන්ඩර් මිල ගණන් සලකා බැලීම

### 07:01 227-5020 ගලිබවුසරය සඳහා ටයර් 02ක් මිල දී ගැනීම

නගර සභාවට අයත් 227-5020 අංක දරන ගලි බවුසරයට ටයර් දෙකක් මිල දී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලදුව අවම මිල ගණන් ලැබුණු ජයන්ති ටයර් හවුස් ආයතනයෙන් එම මිල දී ගැනීම සිදු කිරීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් අවම මිල ගණන් යටතේ මිලදී ගැනීම සිදු කිරීමට මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

### 07:02 56-1906 කෘෘ කැබ් රථයට ටයර් 02ක් ලබා ගැනීම

නගර සභාවට අයත් 56-1906 කෘෘ කැබ් රථයට ටයර් දෙකක් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලදුව අවම මිල ගණන් ලැබුණු ජයන්ති ටයර් හවුස් ආයතනයෙන් එම මිල දී ගැනීම සිදු කිරීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10,000.00ට වැඩි ගෙවීම් මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර ඇති බව දන්වන ලදී.

## 09. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

### 09:01 පුවක්ගහමුල්ල ගොඩැල්ල ළිඳ සංවර්ධනය කිරීම

පුවක්ගහමුල්ල ගොඩැල්ල ළිඳ සංවර්ධනය කිරීම සඳහා වන වියදම් ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 10:01 මුදල් කමිටු රැස්වීම් වාර්තාව

2012.10.18 වන දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව සම්මත කිරීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් නොපැවති බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**10:02 සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව**

2012.10.12 වන දින පවත්වන ලද සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව සම්මත කිරීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**10:03 තානායම් කමිටු රැස්වීම් වාර්තාව**

2012.10.18 වන දින පැවති තානායම් කමිටු රැස්වීම් වාර්තාව සම්මත කිරීමට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 11. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

නැත

## 12. යෝජනා

**12:01 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

1. පොදු වෙළඳපොල මස් කඩ සඳහා ඉලෙක්ට්‍රොනික තරාදියක් ලබා දීම
2. බලන්ගොඩ නගරයේ ඇති යකඩබඩු කඩ ඉදිරිපිට ත්‍රී රෝද රථ නවතා තැබීම වැලැක්වීම

යන යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා විසින් සිදුකරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ඉලෙක්ට්‍රොනික තරාදි ලබා දීම මස් මාලු කඩ සියල්ල සඳහා සුදුසු බව දක්වමින් එම යෝජනාවන් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**12:02 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමාඃ**

1. මෙම සභාව විසින් සිදු කරනු ලබන බදු දීම් දීර්ඝ කාලීන බදු දීම් ලෙස සිදු නොකර වාර්ෂිකව පදනම මත සිදු කිරීම
සඳහා ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් නොවූ බැවින් මහා සභාවේ සම්මත විය.

**12:03 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමාඃ**

1. සරස්වතී වත්ත පොදු සුසාන භූමිය වෙත ආරක්ෂක දැල් ගැසීම
2. බස් නැවතුම්පොලේ ඉවත් කරන ලද ත්‍රී රෝද රථ සඳහා සුදුසු ස්ථානයක් ලබා දීම
3. පක්ෂ බේදයෙන් තොරව ගරු සබාවේ සාමූහිකත්වය රැකෙන පරිදි කටයුතු කිරීමට

සාකච්ඡා කර එකඟතාවයක් ලබා ගැනීම.

4. පහළ කුමාරගම සුසාන භූමියේ සීමාව ආරක්ෂා වන පරිදි කම්බි වැටක් ඉදි කිරීම සහ එහි නඩත්තුව සඳහා කම්කරුවකු යෙදවීම.

5. උඩ ඇල්ලෙපොල 142/4 බෝක්කුව අසළ කුඹුරු ඉඩම අනවසරයෙන් ගොඩකිරීම සම්බන්ධයෙන් විරෝධය දැක්වීම.

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 13. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

### 13:01 2012 සැප්තැම්බර් ලැබීම් විග්‍රහය

- 2012 සැප්තැම්බර් මාසය සඳහා වන ලැබීම් හා වියදම් විග්‍රහය සභාවේ අනුමත විය.

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 5,279,65.21 |
| වෙනත් ලැබීම් | 857,262.37 |
| **මුළු ලැබීම්** | **6,136,921.58** |
| පුනරාවර්තන වියදම් | 4,685,431.75 |
| වෙනත් වියදම් | 737,736.96 |
| මුළු වියදම් | **5,423,168.71** |

- බලන්ගොඩ තානායමේ 2012.10.01 සිට 2012.10.31 වන දින දක්වා වෙළඳ හා ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලද අතර එය සභාවේ අනුමත විය.

## 14. වෙනත් කරුණු

### 14:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා:

ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා සභාව අමතමින් නගර සභා ආඥා පනතට අනුවම කටයුතු කිරීම අගය කළ යුතු බව ද, එමෙන්ම එයින් ලැබී ඇති බලතල ප්‍රකාරව නව තාක්ෂණය සහ භාවිතයන්ට ගැලපෙන පරිදි අවශ්‍ය පරිදි අතුරු ව්‍යවස්ථාවන් සකස් කළ යුතු බව ද ප්‍රකාශ කළේය. එමෙන්ම ජනතාවට අඩු මිලට මාලු ලබා දීම අවශ්‍යතාවයක් බව ද, ඒ සම්බන්ධව සමාජ ක්‍රියාකාරී කණ්ඩායම් කැඳවා තීරණයක් ගත යුතු බවට ද දක්වන ලදී. එමෙන්ම මහා සභාවේ ක්‍රියාකාරකම් රූපගත කිරීම කළ යුතු බවට ද අදහසක් පළ කරන ලදී.

වැවේවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ගෙනැවිත් තිබූ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි 6000ක් අතරින් 1000ක් සොරකම් කර ඇති බව ද, එම සොරකම බලන්ගොඩ පොලිසිය විසින් සිදු කරන ලද අතර එය අල්ලා ගැනීමට හැකි වූ බව ද එතුමා වැඩි දුරටත් ප්‍රකාශ කළේය.

### 14:02 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා:

මෙම මාසය තුළ ආරම්භ කිරීමට නියමිතව තිබූ බියර් හලට විරුද්ධ වීම සඳහා සහයෝගය ලබා දුන් ස්වාමීන් වහන්සේලාට ද, මුස්ලිම්, ක්‍රිස්තියානි, හින්දු පූජකතුමන්ලා ඇතුළු නගර වාසී ජනතාවට ද තමන්ගේ සහ සංවිධායක කමිටුවේ ස්තුතිය හිමි වන බව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

**14:03 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ලබන මාසයේ සිට සම්මත සභා රීතීන්ට අනුව කටයුතු කිරීම ඉතාමත් හොඳ ප්‍රවනතාවයක් වන බවත් එමෙන්ම ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් වලට සවන් දීම ද කළ යුතු බවත් ගරු නාගරික මන්ත්‍රි ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම වෙළඳපොල සීමාව හැකිතරම් නාගරික ප්‍රදේශයට පමණක් පැනවීම සුදුසු බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

**14:04 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමා සභාව අමතමින්, නගරයක මත්පැන් අලෙවිසැල් විවෘත කිරීම සම්බන්ධව බලතල ඇත්තේ සුරාබදු දෙපාර්තමේන්තුවට පමණක් බව ද, එම කටයුත්ත නගර සභාවට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදල නොවන බව ද,නගර සභාවට හැකියාව ඇත්තේ ඒ සඳහා බලපත්‍රය නිකුත් කිරීමට පමණක් බව ද ප්‍රකාශ කළේය. පාසැල් පූජනීය ස්ථාන වැනි තැන් වලට මත්පැන් හලේ සිට නියමිත දුරක් ඇති බව ද එතුමා වැඩිදුරටත් සඳහන් කළේය. මෙය නගර සභාවේ ක්‍රියාකාරකමක් බවට වැරදි අර්ථ දැක්වීම් සිදු කර ගරුතර සංඝරත්නය සහ ජ්‍යෂ්ඨ පුරවැසියන් මෙවන් විරෝධතාවයන්ට සම්බන්ධ කර ගැනීම අනුමත කළ හැකි දෙයක් නොවන බව ද එතුමා ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම නගර සභාවේ අවසරයකින් තොරව විවෘත කිරීමට උත්සාහ කළ මාළු අලෙවි සැල සඳහා විරුද්ධ වීමෙන් නගර සභාවේ ගෞරවය ආරක්ෂා කිරීමට කටයුතු කළ බව ද, නගර සභා ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව මාලු විවෘත කිරීම සිදු කළ හැකි බව ද එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

## 15. අවසානය

**15:01 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

අද දින සභා වාරයේ වැඩකටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දුන් ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන්ට සිය ස්තුතිය පල කරමින් මහා සභාවේ කටයුතු ප.ව. 12.53ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.